**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #May13**

යම් පුවතක් හෝ ලිපියක් සම්පාදනය කිරීමේදී එහි අඩංගු වන කරුණු වල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මාධ්‍යවේදියෙකු වෙසෙසින්ම උනන්දු විය යුතුවේ. ලිපියක් ලිවීමට පෙර එම කරුණු සම්බන්ධයෙන් මනා පර්යේෂණයක් කිරීම වැදගත් වන්නේ එබැවිනි. එසේම එවැනි කරුණු ලබාගත් මූලාශ්‍ර සඳහන් කිරීම මගින්ද ලිපියට මනා බරක් ලැබෙනු ඇත. එසේ නොමැතිව ලිපියක සාවද්‍ය කරුණු අඩංගු වන්නේ නම් එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් වනු ඇත.

ඉරිදා දිවයින පුවත්පතේ පළවී ඇති ලිපියක් සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කිරීම වටී. මෙහි සිංහල ජන සමාජයේ, දමිළ ජන සමාජයේ සහ මුස්ලිම් ජන සමාජයේ වර්ධන වේගයන් සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත. එසේම ශ්‍රී ලාංකික ජනතාව අතර උපත් පාලනයක් සිදුකිරීමේ අරමුණින් යුතුව විදෙස් වෙළෙඳපොළ තුළ අධික මිලකින් යුතු උපත් පාලන පෙති සහ එන්නත් මෙරටට ඉතාමත් අඩු මුදලකට ලබාදෙන බවද එහි කියැවේ. මෙහිදී අප නඟනා පැනය සරල වේ. මෙම ප්‍රකාශයන් සඳහා දත්ත ලබාගෙන ඇත්තේ කොතැනකින්ද? එම මූලාශ්‍රයන් මොනවාද?